## 16. ශීර්ෂය 14 - නීතිපති දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය

### 16.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි |
| (ii) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි |
| (iii) | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 | ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි |

### 16.2 යහපාලනය සහ ගිණුම් කටයුතුභාවය

#### 16.2.1 අභ්‍යන්තර විගණනය

අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් නීතිපති දෙපාර්තමේන්තුවේ ද අභ්‍යන්තර විගණන කටයුතු සිදුකළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක වී නොතිබුණි.

#### 16.2.2 විගණන හා කළමනාකරණ කමිටු

දෙපාර්තමේන්තුවේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

### 16.3 අග්‍රිම ගිණුම

2014 නොවැම්බර් 20 දිනැති අංක 04/2014 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පත් කළ බලයලත් නිලධාරියා විසින් 2014 දෙසැම්බර් 31 දිනට පසුව මුදල් පොත්වල කිසිදු ගනුදෙනුවක් සටහන් කළ නොහැකි පරිදි සටහන් තබා මුදල් පොත පියවා තිබුණද, ඉන් පසුවද මුදල් පොතේ හරට සහ බැරට පිළිවෙලින් රු.5,005,000 ක් හා රු.7,800 ක් සටහන් කර මුදල් පොත නැවත පියවා තිබුණි.

### 16.4 ආදායම් ගිණුම්

විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු126,283,414 ක ආදායම්2014 දෙසැම්බර් 31 දිනට හිඟහිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායමෙන් රු.57,557,165 ක් වර්ෂ 02 කට අධික කාලයක සිට අය නොවී පැවතුණි.

### 16.4 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 01401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව වර්ෂ 01 සිට වර්ෂ 08 ක් දක්වා කාල පරාසයක සිට අයවීම් හිඟහිටව තිබුණු ශේෂවල එකතුව රු2,213,928 ක්වූ අතර, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

16.5 කාර්යසාධනය

-----------------

විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ අංශ 07 ක කාර්යසාධනය පහත පරිදි විය.

| ශාඛාව | 2014 වර්ෂය තුළ විවෘත කළ ලිපිගොනු සංඛ්‍යාව | අධිචෝදනා යැවූ ගොනු සංඛ්‍යාව | උපදෙස් දුන් ගොනු සංඛ්‍යාව | නිදහස් කළ ගොනු සංඛ්‍යාව | 2014 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කළ ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| සිවිල් අංශය | 2686 | - | - | - | 118 |
| අපරාධ නඩු අංශය | 5496 | 2210 | 1304 | 870 | 3970 |
| රාජ්‍ය නීතිඥ අංශය | 128 | - | - | - | 1712 |
| ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය | 392 | - | - | - | 680 |
| සංස්ථා අංශය | 1885 | - | - | - | 1751 |
| කාන්තා හා ළමා අපචාර නඩු ඒකකය | 4428 | 739 | 540 | 909 | 2188 |
| මහජන පෙත්සම් අංශය | 530 | - | - | - | 220 |
| එකතුව | 15545 | 2949 | 1844 | 1779 | 10639 |

සිවිල් අංශය මඟින් විවෘත කළ ගොනු වලින් වැඩි සංඛ්‍යාවක් රාජ්‍ය නීතිඥ අංශය විසින් ද කටයුතු කර තිබුණි.

16.6 අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 271 | 173 | 98 |
| (ii) තෘතියික මට්ටම | 12 | 10 | 02 |
| (iii) ද්විතියික මට්ටම | 166 | 97 | 69 |
| (iv) ප්‍රාථමික මට්ටම | 233 | 207 | 26 |
| (v) වෙනත් | 130 | - | 130 |
| එකතුව | 812 | 487 | 325 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 325 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. ගොඩනැගිලි ඉඩ පහසුකම් නොමැතිවීම නිසා පුරප්පාඩු වී ඇති තනතුරුවල නිලධාරීන් බඳවාගැනීම සිදුකළ නොහැකි බව නීතිපති විසින් 2015 අගෝස්තු 03 දින විගණනයට දැන්වීය.